අප සමාජයේ භාවිතා වන ඇතැම් යෙදුම් බැලූ බැල්මට ගැටළුකාරී නොවූවත්, මදක් නැවතී බලන විට එම යෙදුම් ගර්හාත්මක, අවමානාත්මක හෝ කොන් කිරීමක් ජනිත කරන සුළු බව දැකිය හැක. ඉංග්‍රීසි බසින් සඳහන් වන "Mistress" වැනි යෙදුමක් ඊට උදාහරණයකි.

Mistress යන යෙදුමෙන් හැඟවෙන්නේ විවාහයට පිටින් වන සබඳතාවයක සිටිනා කාන්තාවකි. නමුත් Mistress යන යෙදුමෙන් ජනිත වන ගර්හාත්මක අදහසට පර්යාය වන පුරුෂ ලිංගික යෙදුමක් තිබෙන්නේද? ගැටළුව පැමිණෙන්නේ එතැනිනි. විවාහයට පිටින් වන සබඳතාවයක සිටින්නට සාමාන්‍යයෙන් දෙදෙනෙකු අවශ්‍ය වුවත්, Mistress යන යෙදුම ඔස්සේ අවමානයට පාත්‍ර වන්නේ කාන්තාව පමණි!

මේ අනුව බලන විට "Mistress" යන යෙදුම ඔස්සේ කාන්තාව, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීමකට බඳුන් නොවන්නේද?

මෙම යල් පැනගිය, ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කොන් කිරීමක් සිදුකරන Mistress යන යෙදුම භාවිතා නොකරන මෙන් 2020-2022 වසර සඳහා වන The Associated Press AP Stylebook මගින්ද නිර්දේශ කරයි. ඒ වෙනුවට companion, friend හෝ lover වැනි යෙදුමක් යෝග්‍ය වේ යැයි ඉන් යෝජනා කෙරේ.

මූලාශ්‍ර:

https://www.apstylebook.com/
https://www.poynter.org/.../the-word-mistress-is.../

**#MediaEthicsSL #lka #sinhalanews #DailyNews**